Do You Want To Migrate To Australia?

For All Your Australian Migration Visa Requirements

- General Skilled Migration (onshore & offshore)
- Employer Nominations
- State Government Sponsorship
- Business Migration
- Family Visitor
- Spouse / De facto
- Graduate Skilled Visa Subclass 485/885 & 886
- Student Visa Extension
- MRT and RRT Appeals
- Skills Assessment

MIA
MEMBER OF MIGRATION INSTITUTE - OF AUSTRALIA -
MRAN 0958576

We provide professional and cost effective service to our clients.
Step by step assistance and guidance until the end.

Ananda Kumarasiri
Australian Migration Consultant
Dip. Marketing
Grd. Cert. Imm. Law -VU
MIB (Inr.Trade) –DU

Contact Details:
No 1 Heathcote Court,Endeavour Hills,Vic 3802,Australia.
Tele/Fax +61 3 9708 1168 Mobile +61 4 2585 1577

No 88, Diyawanna Garden,Battaramulla,Sri Lanaka.
Tele/Fax +94 112 787 645 Mobile +94 773 249 923
anandakumarasiri1@gmail.com

Professional dedication to make your dreams become a reality.

MASS Design - Sri Lanka - www.mass-designing.com / www.mass.lk / admin@mass.lk

වි. ක. ධර්මබන්ධු මහතා ලියනු ලබන **සුභාෂිතයෙන්** ළඳන කළාපයේ පළවෙයි

"පුංචි අන්දරේ" සහ "දේව වස්ත්‍රය"

කුසුම්සිරි සහ යශෝධරා නව රංග කාර්යද්වයය වන "පුංචි අන්දරේ" සහ "දේව වස්ත්‍රය" නාට්‍යයද්වයයේ නිෂ්පාදන කටයුතු 2009 ඔක්තෝබර් 4 සහ 2010 ජනවාරි 31 යන දෙදිනයන්හිදී සුබ මොහොතින් ඇරඹින. "පුංචි අන්දරේ" වූ කළි ලාංකික ජන සාහිත්‍යයේ ප්‍රචලිත වූ අන්දරේගේ කතාන්දර කිහිපයක් ඇසුරුකොටගෙන නව ආරකට නිර්මාණය වන්නා වූ ළමා වැඩිහිටි දෙපාර්ශවයටම රස විඳියහැකි අයුරේ වේදිකා නාට්‍යයකි. ළමුන් තුළ වැඩිහිටියන් තුළ අපේක්ෂ තවරාළිමට, අපේක්ෂ සිහිපත් කරලීමට වෙර දැරීමකි.

"දේව වස්ත්‍රය" සෞන්දර්යාත්මක තලයෙන් පෝෂිත, ගැම් රංග ශෛලියේ ඇසුර ලැබ, මූලිකවම වැඩිහිටි ප්‍රේක්ෂකාගාරයක් උදෙසා නිර්මාණය වන්නා වූ දේශපාලන ප්‍රහසනයකි. සෞන්දර්යාත්මක දේශපාලන ප්‍රහසනයකි. කුසුම්සිරි සහ යශෝධරා විසින් ශ්‍රී ලංකා රංග නිකේතනය යටතේ මෙහෙයවන ළමා නාට්‍ය වැඩමුළුව සහ වැඩිහිටි නාට්‍ය වැඩමුළුව මුල්කොට ගනිමින් මේ නාට්‍යද්වයය නිෂ්පාදනය කිරීම සිදුකෙරෙනු ඇත. 2010 සැප්තැම්බර් 11 සෙනසුරාදා මංගල දර්ශනය මෝල්බර්න් පුර ක්‍රේන්බර්න් නගරයෙහිදී පැවැත්වීමට නියමිතය.

"පුංචි අන්දරේ" සහ "දේව වස්ත්‍රය" සඳහා රංගනයෙන් දායක වන ළමා කැළ මෙසේය.

තිළිණි රණසිංහ, වසුන්ධරා ඕපනායක, හසිනි ඉලංගරත්න, නෙවින් වල්පොල, රන්දු වල්පොල, නිමාලි පැල්පොල, මංජිත වීජේසිංහ, නෙත්මා මල්ලව, නුවන් රණසිංහ, කසුන් මුණසිංහ, මනීෂා ගමගේ, නිලාන් ගමගේ, කසුනි පාදුක්කගේ, දිමිති කස්තූරිරත්න, දිළිෂා වල්පොල, ලක්ෂාන් වල්පොල, කාවින්ද මුණසිංහ, සම්මානි සේනාරත්න, ජනනි මුණසිංහ, ජනනි සේනාරත්න, මධුර බණ්ඩාර, ජනනි කුරුකුලරත්න, නිලූමි ජයරත්න, විනුකි මල්ලව, අමාතදි දිසානායක, දිළිත වීජේසිංහ, තරුෂි ෆර්නැන්ඩු, තිෂාරා කත්රිආරච්චිගේ, ඉසිනි මුත්තුමුව, තරුෂ පිරිස්, දෙවිමි බණ්ඩාරහැක, අයන්ති කුමාරනායක, ෂෙහාන් ඩි මෙල්, අර්චනා අත්ලගේ, නිළිනිකා පස්හැන්න, දිහිති ලියනආරච්චි, කවිති කුරුකුලරත්න, ඉන්දු ලියනආරච්චි.



රංගනයෙන් දායක වන වැඩිහිටි කැළ මෙසේය.

දයානන්ද විමලසිරි, චින්තක සමරකෝන්, ප්‍රසාද් විජයබන්දු, ප්‍රසන්න කුරුකුලරත්න, වසන්ත මුතුමාල, සුසන්ත වීජේසිරි, දිනෙෂ්ක ජයකොඩි, තුසිත දසනායක, රන්නා ගුරුසිංහ, දිළිනි වල්පොල, සුගත් වල්පොල, කසුනි ජයවර්ධන, කණිෂ්ක රාජපක්ෂ

නාට්‍යද්වයයේ වේදිකා පරිපාලනයෙන් තුසිත දසනායක සහ නිශ්ශංක මල්ලව ද රංග ආලෝකයෙන් සුපින් බණ්ඩාර ද දායක වනු ඇත. පුංචි අන්දරේ හි තනු නිර්මාණය යශෝධරා සරච්චන්දු විසින් ද දේව වස්ත්‍රය හි තනු නිර්මාණය සහ නාට්‍ය ද්විත්වයේම සංගීතය මෙහෙයවීම හාණුක මනෙර්රත්න විසින් ද සිදුකෙරෙනු ඇත.

"පුංචි අන්දරේ" සහ "දේව වස්ත්‍රය" කුසුම්සිරි ලියනආරච්චිගේ රචනයන් ද්විත්වයක් වන අතර කුසුම්සිරි සහ යශෝධරා අධ්‍යක්ෂණයෙන් සපිච් වනු ඇත.

සංවිධායකයින් උදෙසා සටහන :

අමතන්න.
කුසුම්සිරි සහ යශෝධරා
Phone : +61 3 87949818
Email: kusumsiri@ranganikethanaya.org

බස් දොස්

දෙවන කොටස

මම අද කිසිම කෙනෙකුගේ ලියවිල්ලක ණ/න, ළ/ළ, ෂ/ශ බේදයත් උක්තානුක්ත බේදයත්, අල්පප්‍රාණ/මහාප්‍රාණ බේදයත් නොසොයමි. එයට හේතු පහදා දීමට වඩා පසුගිය අප්‍රේල් සන්නසෙන් නිදසුන් දැක්වීම මනාවැයි සිතමි. මෙහි දී අදාළ ලේඛකයන් මා සමග උරණ නොවෙතියි සිතමි.

පසුගිය අප්‍රේල් කලාපයේ මගේ ලිපියේ යතුරු දොස් රැසක් දක්නට ලැබේ. ලිපිය අවසන ඇති 'සඹඵරුණ සඹඵරක ඒ ඇත්තේ ඒ වචනය 'රු. වළින් අවසන් වන නිසා විය හැකි බවත් එසබසිඵැරු. එසබසිඵැරස්ක ඒ ඇත්තේ ඒ වචනය .රු. වළින් අවසන් වන නිසා විය හැකි බවත් මගේ හැඟීමයි. ඒ නීතිය අනුව .රු. වළින් අවසන් වන 'සඹඵරුණ සඹඵරස්ක විය යුතුය. ඵැඵරු, ඵැඵරසප උවත් ඵැඵරුඵැඵරසප (මීටරික්) විය යුතුය' යන කොටස නිවැරදි ව තේරුම් ගන්න. ඒ මගේ අදහසක් පමනි. මම ඉංගිරිසි භාෂා විශාරදයෙක් නොවෙමි.

අප්‍රේල් සන්නස කලාපය

(03) වන පිටුව (කතු වැකිය) 'හය වන වසරට' නිවැරදි ම යෙදුම 'ස වන වසරට' විය යුතුය. හතර, අට ප්‍රකෘතිය නිසා 'හතර වන/අට වන වසර නිවැරදිය. එහෙත් දෙ - තුන් පස් - ස - සත්-නව - දස වැනි වසර මිස දෙක - තුන - පස - සය - සත - නවය - දහය වැනි වසර නිවැරදි නො වේ. කෙසේ වෙතත් ස වැනි' මෙන් ම අද බාවිතා වන 'සය වැනි' යන්න ද නිවැරදි සේ පිළිගත යුතු යයි සිතමි. වෙළඳ පොළක්, කරුනු ඉදිරිපත් කිරීමෙන් , දුෂ්කරතා පැමිනිය ද, කාන්දු කර යන යෙදුම් සම්මතයෙන් අඳත් වූ බවක් පෙනේ. ත/ණ , ළ/ද දොස් යතුර දොස් විය හැකිය. එහෙත්, 'කාන්දු වීම' යන්නේ තේරුමක් ඇතත් 'කාන්දු කා වැදීදීම' යන අදහස දීම සඳහා එය ලියා ඇති බව පෙනේ. වතුර ගැළීමේත් ගලන්නට සැලසීමේත් නිවරදය, එහෙත් 'වතුර ගැළීම' සදොස් ය.

(04) වන පිටුව..'කස්තිරම' එක්තැනක 'පිළිසදර' තවත් තැනක 'පිදිසදර' වීමත් පුලුවන් (දන්නප ළ), සරළ (මුර්දප් ළ) වීමත් යතුර දොස්ය. අත් ලියමන යතුර, ලියමනේ දී වෙනස්වීම අපේ බාසාවේ බෙහෙවින් සිදුවේ. 'අපට නැහැනේ එහෙම වාසියක්' යනුවෙන් සුදු තරුණිය කියනදේ මට තේරුම් ගත නොහැකි වීම ගැන දුක් වෙමි.

(09) ගීතාංජලියේ - රල පෙළ, හැළවෙන යන තැන් දන්නප් වීමත් යතුර දොස් විය හැකි ය. සැඟවි අරුතක් ඇති ඒ ගැඩිපැදියේ (නිදහස් කවියේ) අදහස උරාගෙන රසවිඳීමට නො හැකි වීම ගැන ද දුක් වෙමි.

(11) ' ශිෂ්‍ය නායකයෝ....' තුළ, ප්‍රශ්ණ කළේ , සියළු එකලොස්වෙනි , පත්වුනේ , කෙලින් ම , පණිත රිදවුන් , ඉණිමං , දැලි පිහි, පෙණුනේ, (පෙනුණි/නොපෙනුණි) නොපෙණුනි , බලන කළ , දුම්කොල , ස්ටඩ් කළේ , ලග දී යන පදවලින් සමහරක් යතුරු දොස් බව පෙනේ. 'ශිෂ්‍ය නායකයින් මට නිතර හමු විය. (ශිෂ්‍ය නායකයෝ..... හමුවුහ), ශිෂ්‍ය නායකයෝ කිසි සේත් ම සැබෑ නායකයෝ නොවෙතිය යන්න , (ශිෂ්‍ය නායකයන් ..... නායකයන් නොවෙතිය යන්න), ගුරුවරුන් සහ විදුහල්පතිවරුන්ගේ කමෙත්ත (ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ /ගුරුවරුන්ගේත් විදුහල්පතිවරුන්ගේත්) හාමුදුරුවෝ ප්‍රශ්න කර තිබුනේ (හාමුදුරුවන්.... තිබුණේ), අපි සියළු දෙනාම... පාසලට පැමිණියෝ වීමු (අපි සියලු දෙනාම....), වෛද්‍යවරයෙක් ළෙස (වෛද්‍යවරයකු) අවශ්‍යතාවයක් (අවශ්‍යතාවක්)

(14) 'කලාව සහ' .... ලේඛණ, ඇළුම්, කළාප, දියණියයි, දරණ, අළුත් , තුලින් , ගැටළුව, අසඳ, ප්‍රශ්ණයක්, සැලකිළි , අතුලත්, යන පද සමහරක් යතුරු දොස් විය හැකි ය. ඊ යන්නෙන්, පරව, මූර්දජ 'ණ' යන්න ලිවිය යුතුය යන රීතිය අනුව දරණ ලියතක් 'දරන්නා - දරන්නේ' යන පද ලිවිය නොහැකිය.

'ආණ, අණි, අණු' ප්‍රත්‍ය යෙදුනු පද බහු වචනයෙන් ම තැබිය යුතුය යන රීතිය දන් කඩ කරනු දක්නට ලැබේ. දියණි, නැඟණි, මෑණි, නැන්දණි, පුතණු, මයිලණු, මලණු, පියාණ, සිටාණ, කිවියාණ, කෙලඹියාණ වැනි පද ඕ/අන් යන විබක්ති ප්‍රත්‍ය සහිතව ලිවීම පිළිගත් රීතියයි. ඒ පද බහු වචන ලෙස සැලකේ.

මෑණිය, පුතණුවා, මයිලණුවා, මලණුවා, පියාණ, සිටාණ, කිවියාණ, කෙලඹියාණ යන පද දිහා බලන විට දියණිය, නැඟණිය, නැන්දණිය යන පදවල අදැය පෙනේ.

මෑණි කෙනෙක් පුතණු කෙනෙක් සිටාණ කෙනෙක් යනු වෙන් ලියූ විට ඒ අදැය මැකේ.

"අතිදක්ෂ ලේඛක ලේඛිකාවන් ප්‍රමාණයක් ද බිහි විය. (.....ලේඛක ලේඛිකාවෝ රාශියක්/සමූහයක් ද බිහි වූහ)

"ජගත්.... නැත. මා ද නැත" මා / අප / ඔවුන් / ඈ මිනිසුන් ආවේ නැත / ගියේ නැත / කෑවේ නැත / දැන සිටියේ නැත නිවැරදිය. පූර්ව ක්‍රියා / භාව ක්‍රියා පද සමග ඇත / ඇති, නැත / නැති , තිබේ යෙදෙන විට කර්තෘ අනුක්ත විය යුතු ගිසා ය, ඒ වැනි නිවැරදි වන්නේ.

අනෙක් තැන්වල 'මම/අපි අද ගෙදර නැත. අඳුරා / අඳුරෝ අද පාසලේ නැත, ගැහැනියක් / පිරිමියෙක් / ගැහැනු / පිරිමි නැත. නායකයෙක් / නායකයෝ ඇත. ඔවුන්.....එන විට මම / අපි එතන ඇත / නැත. ආදි වශයෙන් කර්තෘ උක්ත විය යුතු ය.
-..... සොඳුරු උණක් තිබිය යුතු ය" යන්නේ සැඟවි අරුත සමහරන්ට තේරුම් ගත නොහැකි ය. අපේ නිවසේ ම කෙනෙකු ඒ වැකියේ තේරුම මගෙන් ඇසුවේ ඒ නිසාය. ඒ 'සොඳුරු උණ' තේරුම් යන විදියට තවත් වැකියක් යෙදුනා නම්... (කියලා: වැඩක් නෑ)

(15) 'සිනුවර හසුන' වෙලඳ, මිළ, දෙමල, ඇසුනි, සියළු, පහලොවක්, ප්‍රශ්ණ යන වචන සදොස් ය, යතුරු දොස් විය හැකි ය.

ගෙවල්වලින්, පාරවල්වල, රටවල්වලට වැනි වචනවල 'වල්' ප්‍රත්‍යය දෙවරක් යෙදීම, සදොස් උවත් අද බොහෝ දෙනා ඒ වැරදි වහරට හුරු පුරුදු වී සිටිති. එහෙයින් (කඩ වල් වල් ඉන්) කඩවල්වල් ඉන් කඩවල්වලින් - යන තනි වචනය ද සදොස් ලෙස සැලකිය නො හැක. 'වල්' ප්‍රත්‍යය මුල් පදය හා බැඳී තිබීම යතු ය.

මා ලිපි කීපයකින් ගත් මේ දොස් හුවා දැක්වූයේ අපේ ලියන බසේ වෙනසක් ඇතිවිය යුතු බව පෙන්වා දීමට විනා අදාල ලේඛකයන් අතින් සිදු වී ඇති අඩුපාඩු - පමා දොස් පෙන්වා දීමට නො වේ. ඒ නිසා ඒ ලේඛකයන් මෙය බරට ගත යුතු නැත. මගේ එක් තර්කයක් නම්, ඔහු / ඔබ / ඈ යන පද උක්තය හැටියටත් අනුක්තය හැටියටත් පිළිගත්තේ නම්, එයින් කිසි අවිලක් නොසිදු වන්නේ නම්, මා / ඔවුන්/මිනිසුන් උක්තය ලෙස ලිවූ විට වැරදි ලෙස දකින්නේ ඇයි ද යන්නයි.

වි.ක. ධර්මබන්දු